ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය - 2021/2022

LLU6814/LWU4326 - දිලික්ත නීතිය

කාලය - පැය එකයි. (01)

---

දිනය - 2022.09.16 වේලාව - ප.ව.03.30 - ප.ව.04.30

---

සම්පූර්ණ ප්‍රශ්න ගණන 02 යි.
එක් ප්‍රශ්නයකට පමණක් (01) පමණක් පිළිතුරු සපයන්න.

| |
|---|
| අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.<br>ඕනෑම ආකාරයක අවසර නොමැති ලිපිලේඛන, ජංගම දුරකථන හා වෙනත් විද්‍යුත් උපාංග විභාග ශාලාව වෙත රැගෙන ඒම විභාග වරදකි. |

01. අධිකරණයන් නෛතික වරදකාරිත්වයේ සීමාවන් (රෝම ලන්දේසි නීතියදී) හෝ අවධානයේ යුතුකමේ සීමාවන් (ඉංග්‍රීසි නීතියදී) සළකා බලනුයේ අනෙකුත් පුද්ගලයන්ගේ අපරීක්ෂාකාරීත්වය හේතුවෙන් කොපමණ ප්‍රමාණයක ආරක්ෂාවක් සමාජයට අවශ්‍ය ය ද? යන කාරණය මතය. සාමාන්‍යයෙන් බොහෝ නීති ක්‍රමයන්හි අධිකරණයන් ශුද්ධ මූල්‍ය හානියට පත් වූවන්ට, පුද්ගලයන්ට සහ දේපලට සිදු වන භෞතික හානිවලදී මෙන් සාපේක්ෂව මෙකී ආරක්ෂාව ලබා දීමට මැලි වේ. ඒ අනුව නොසැළකිලිමත් ප්‍රකාශයන් නිසා සිදුවන ශුද්ධ මූල්‍ය හානි සම්බන්ධ රීතීන් අනෙකුත් නොසැළකිල්ල සම්බන්ධ කාරණාවන්ට වඩාත් සීමා සහිත වේ.

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද?

නොසැළකිල්ල සම්බන්ධයෙන් වන සාමාන්‍ය රීතීන්ට සාපේක්ෂව නොසැළකිලිමත් ප්‍රකාශයන්ට සම්බන්ධ වන රීති වඩා සීමාකාරී වන්නේ යයි ඔබ සිතන්නේ ද යන්න පැහැදිලි කරන්න. දකුණු අප්‍රිකානු සහ ඉංග්‍රීසි නීතියේ ඉතා මෑතකාලීන සංවර්ධනයන් සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර සනාථ කිරීම සඳහා නඩු තීරණ උපුටා දක්වන්න.

02. පොදු සහ සිවිල් නීති යන ක්‍රම දෙකෙහිම අධිකරණ ස්නායු කම්පනය සහ මානසික හානි සඳහා විත්තිකරුවකු වෙත වගකීම පැවරීමට මැලිකමක් දක්වයි. ඒ සඳහා හේතු වී ඇත්තේ ව්‍යාජ හෝ අනවශ්‍ය හිමිකම් පෑම්, අධික නඩු සංඛ්‍යාවක් පැවරීමට ඇති හැකියාව, විත්තිකරු වෙත සහ රක්ෂණකරු වෙත පැවරෙන වගකීම සහ මානසික රෝගී තත්ත්වයන් පිළිබඳ ඇති වෛද්‍ය විද්‍යාත්මක දැනුම අවම වීමයි.

එංගලන්තය, දකුණු අප්‍රිකාව සහ ශ්‍රී ලංකාවේ අධිකරණයන් ස්නායු කම්පනය සම්බන්ධයෙන් වන හිමිකම් පෑම් හඳුනා ගනිමින් ඒ සම්බන්ධ නීතිය සංවර්ධනය කිරීමේ දී ප්‍රශ්නගත තත්ත්වයන්ට කුමන ආකාරයට ආමන්ත්‍රණය කර ඇත් ද? යන්න සාකච්ඡා කරන්න.

වෙනත් අධිකරණයන් මේ සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රවේශයන් සන්සන්දනය සහ විභේදනය කර මෙම වගකීම සම්බන්ධව ඔබ කුමන ආකාරයක විසඳුම් සොයන්නේ ද යන්න පැහැදිලි කරන්න.

අධිකරණ තීරණ මගින් ඔබේ පිළිතුර සනාථ කළ යුතුය.

හිමිකම් ඇව්රිණි.